# 11 ශ්‍රේණිය

# නර්තනය

## සාම්ප්‍රදායික ගායනා



අන්තර්ගතය - වී.ඒ.කේ.පී. සංජීවනී - බප/කැල/සාන්ත ෆ්‍රැන්සිස් ම.වි., කැලණිය
සැකසුම - ජී.ඒ.ඩී. තාරකා - මාර/ මහින්ද රාජපක්ෂ විද්‍යාලය , මාතර

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# සාම්ප්‍රදායික ගායනා

ශාන්තිකර්ම ආශ්‍රිත ගායනා සාම්ප්‍රදායික ගායනා වලට අයත්ය. එම ගායනා **ආඝාතතාත්මක** හා **අනාඝාතාත්මක** ලක්ෂණ වලින් යුක්තය.

මේවා වර්ග 02 කි.



ග්‍රහ පන්ති කවි



කඩතුරා කවි


Copyright © e-thaksalawa.moe.gov.lk


# ග්‍රහ පන්ති කවි

- උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ ශාන්තිකර්මයක් වන බලි ශාන්තිකර්මයේ ගැයෙන සුවිශේෂ ගායනා විශේෂයකි.
- බලි ශාන්ති කර්මය පවත්වනු ලබන්නේ **ඉරු, සිකුරු, අඟහරු, රාහු, කේතු, සෙනසුරු, සඳු, බුධ, බ්‍රහස්පති,** යන නව ග්‍රහයින්ගෙන් පැමිණෙන්නාවූ අපල, උපද්‍රව, දෝෂාන්ධකාර, ලෙඩදුක් කරදර ආදීන්ගෙන් සෙතක් ශාන්තියක් බලාපොරොත්තුවෙනි.
- ප්‍රාදේශීය වශයෙන් බලි ශාන්ති කර්මය විවිධ වුවත් ඒ සියල්ලෙහිම අරමුණ ග්‍රහයින් වෙතින් පැමිණෙන පෙර කී දෝෂ දුරු කරවා ගැනීමයි.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# බලි යාගයේ සුවිශේෂිත්වය

- ග්‍රහ දේවතාවුන් සඳහා පවත්වන්නක් වීම.
- එක් එක් ග්‍රහයින්ගේ රූප ඇඹීම හා ඇඳීම එහි සැරසිලි වල විශේෂ අංගයක් වීම.
- නර්තනයට වඩා ගායනයට ප්‍රමුඛත්වයක් දීම.
- ප්‍රධාන වාද්‍ය භාණ්ඩයට අමතරව උඩැක්කිය යොදා ගැනීම.
- තාල තැබීමට අත්මිණිය යොදා ගැනීම.




Copyright © e-thaksalawa.moe.gov.lk

## ග්‍රහ පන්ති කවි

සිරිවස ගෙන අසු නැගෙමින් නොලසා
සිරිබර ඉඹුලේ තුරු රැස නිවෙසා
පිරිබලි කොකුමෙන් ඉඳුරේ නිවෙසා
හිරු දෙවි මෙ ඔබට දෙන් සෙත සලසා

කොකුම් පාට කිතුලින් බත් වළඳා ඉඳුරට හිමිවන
අතින් රැගෙන සිරිවසකුත් තුරඟුන් නැඟී ඉඹුල් විමන
නිතින් පැමිණ එන උවදුරු ඉරිදා මුල් කොට අරගෙන
දුකින් මුදා සැපත ලැබෙයි ඉරු සෙත් දී ආ වඩවන

ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට හිරු දෙවි අධිපති වන්නේ
රන්සිරි වස ගෙන සුරත දරාගෙන තුරඟෙකු පිට වැඩ ඉන්නේ
ඇතියම් රෝ දුක් දුරැර දමා නිති විරා කලක් වැජ ඹෙන්නේ
ඉන්ද්‍ර දිසාවෙන් හිරු දෙවි වැඩලා ග්‍රහ මේ දොස දුරලන්නේ


Copyright © e-thaksalawa.moe.gov.lk

# කඩතුරා කවි

- ශාන්තිකර්ම වලදී ආතුරයා හා යහන අතරින් දෙපසින් අල්ලා සිටින සුදුරෙදි කඩක් ඇත.මෙය කඩතුරාව වේ.
- කඩතුරාව ඉවත් කර ආතුරයා යහනට මුහුණ පා සිටීමට ඉඩ සලස් වන්නේ කඩතුරා කවි ගායනයෙන් අනතුරුවය.
- මේවා විවිධ නාද මාලා අනුව ගායනා කරයි.
- මෙම කවි ගායනයෙන් පසුව කඩතුරාව ඉවත් කිරීමට අවසර ලබාගනී.


Copyright © e-thaksalawa.moe.gov.lk

## කඩතුරා කවි



- සිහින් සිනිඳු සළුව පැළඳ විත් උන් මරඟන
  වහන්ස නුඹ අප අතහැර මන්ද මහණ වුණ
  අහංකාර ඒ මරඟන දැක්කේ බුදුගුණ
  මිහින්තලා ධාතු බෙලෙන් කඩතිර හරිමින



- ඈත එපිට දීපංකර මුණි විවරණ ගන්නේ
  මෑත කපේදී මතු බුදු වෙමැයි සිතා ගන්නේ
  භූත පිසස් යක්ෂ රෝග භය දුක දුරු වන්නේ
  ජේතවනාරාමෙ බලෙන් කඩතිර හරිමින


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk